**ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය - 2015**

-----------------------------------------------

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2010 අංක 12 දරන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනතේ 23 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ සභාපති වෙත 2016 මැයි 19 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000– 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම් වලදී, අවස්ථාවෝචිත උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති - 01

ප්‍රමිතිය ප්‍රකාරව ජංගම නොවන වත්කමක් ලෙස හඳුනා ගත යුතු රු.295,300 ක් වටිනා ආයතනික නාම පුවරුව අයභාර වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) උපචිත පදනම මත ගිණුම් පිළියෙල කර ඇති නමුත් ප්‍රාග්ධන වත්කම් අත්පත් කරගැනීම සඳහා වූ රු.194,805 ක වගකීම ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කම්කරු දෙපාර්තමේන්තුවේ හා කම්කරු අමාත්‍යාංශයේ නිලධාරීන් ආයතනයෙහි සේවයේ යොදවා වැටුප් වශයෙන් රු.12,297,470 ක් වූ මුදලක් දෙපාර්තමේන්තුවේ හා අමාත්‍යාංශයේ වැය ශීර්ෂයන්ගෙන් ගෙවා තිබුණු අතර මෙම වියදම් ආයතනයේ ගිණුම් වලට ගලපා නොතිබීම නිසා ආයතනයේ සමුච්චිත අතිරික්තය සහ රජයේ දායකත්වයද මෙම වටිනාකමින් අඩුවෙන් පෙන්නුම් කෙරුණි.

(ඇ) නීත්‍යානුකූල අයිතිය පවරා නොතිබූ සංචිත වාහනයක් ලෙස භාවිතා කිරීමට අමාත්‍යාංශයෙන් ලැබී තිබූ රු.1,250,000 ක් වටිනා මෝටර් රථය ආයතනයේ වත්කමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට සෘජු බැංකු තැන්පතු රු.50,000 ක් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.3 නීති රීති සහ රෙගුලාසිවලට හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/ 02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය පරිදි පරිගණක උපාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.1,233,658 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.4,491,642 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,257,984 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. පුනරාවර්තන ප්‍රදාන රු.2,306,383 කින් වැඩි වුවද

සේවක පාරිශ්‍රමික වියදම් රු. 5,710,296 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය සමඟ ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී ආයතනයේ වියදම ඉක්ම වූ ආදායමේ අතිරික්තය අඛණ්ඩව අඩුවෙමින් පවතින අතර සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකිල්ලට ගත්විට 2011 වර්ෂයේදී රු.7,260,727 ක් වූ ආයතනයේ දායකත්වය 2013 වර්ෂය වන විට රු.2,861,026 දක්වා අඩු වී තිබුණද 2015 වර්ෂයේ දී එය රු.9,557,107 දක්වා වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 4.1 කාර්යසාධනය

---------------

වෘත්තීය සමිති අධ්‍යයන ආයතනයක් පිහිටුවීම, පර්යේෂණ පැවැත්වීම, සමීක්ෂණ පැවැත්වීම හා ශ්‍රී ලංකාවෙහි කම්කරු අධ්‍යාපනය ප්‍රවර්ධනය අරභයා පුහුණුව සැපයීම සහ ඒ සම්බන්ධ හෝ ඊට අනුශාංගික කරුණු ඉටු කිරීම ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ ප්‍රධාන අරමුණ විය. ආයතනයේ අරමුණු ඉටු කිරීම සම්බන්ධ පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දේශීය හෝ විදේශීය ආයතන සමඟ සහයෝගිත්වයෙන් ශ්‍රම අධ්‍යයන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සේවකයින්ගේ සුභසාධනය සහතික කිරීම පිණිස පියවර ගැනීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් ක්‍රියාකාරකම් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාවට නංවා නොතිබුණි.

(ආ) ශ්‍රම අධ්‍යයනය පිළිබඳ සම්මන්ත්‍රණ, වැඩමුළු, සම්මේලන සහ රැස්වීම් පැවැත්වීම සහ සඟරා, ජර්නල්, වාර ප්‍රකාශන සහ පොත් පළකිරීම හා පර්යේෂණ පැවැත්වීම, සමීක්ෂණ පැවැත්වීම සහ ශ්‍රම අධ්‍යයනයට අදාල පාඨමාලා සඳහා විධිවිධාන යෙදීම සම්බන්ධ කිසිදු ක්‍රියාකාරකමක් වර්ෂය තුළ සිදුකර නොතිබුණි.

(ඇ) පුස්තකාල හා තොරතුරු සැපයීමේ සේවා පිහිටුවීම හා ඒවා නඩත්තු කිරීම සඳහා විධිමත් පුස්තකාලයක් ස්ථාපිත කර සිසුන්ගේ පරිහරණය සඳහා ලබා දී නොතිබූ අතර මෙම ආයතනය හා සමාන අරමුණු සහිත ජාතික හා විදේශීය ආයතන, සංවිධාන, සංගම් සහ සමිති සංගම් සමීප සහයෝගීතාවයෙන් කටයුතු කිරීම ද මෙමගින් අරමුණු කර තිබූ නමුත් එවැනි ක්‍රියාකාරකම් සිදුකර නොතිබුණි.

(ඈ) ආයතනය විසින් සහතික සහ ඩිප්ලෝමා පාඨමාලා ආරම්භ කර තිබුණද ඒ සඳහා විශ්වවිද්‍යාල සහ ඒ හා සමාන ආයතනවල සහාය ලබාගෙන නොතිබුණි.

සමස්ථ කරුණු අනුව මෙම ආයතනය පිහිටුවීමේ ප්‍රධාන අරමුණු අතරින් ක්‍රියාත්මක තත්ත්වයේ පවතිනුයේ ශ්‍රම අධ්‍යයනයට අදාල පාඨමාලා පැවැත්වීම පමණක් වන අතර ආයතනය ආරම්භ කර වසර පහක් ගතවී තිබුණද පනතේ ප්‍රධාන අරමුණු 05 ක් ම ඉෂ්ඨ කර ගැනීමට අපොහොසත් වී තිබූ බව නිරීක්ෂණය විය.

### 4.2 අධ්‍යයන පාඨමාලා මෙහෙයවීම

--------------------------------

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විගණන පරීක්ෂාවට භාජනය වූ පාඨමාලා 9න්, පාඨමාලා 3ක් පෙර වර්ෂයට සාපේක්ෂව ආදායම් ඉපයීම සියයට 27.9කින් වර්ධනය වී තිබුණු අතර පාඨමාලා 06ක ආදායම පෙර වර්ෂයට වඩා සියයට 27.7කින් පිරිහී තිබුණි.

(ආ) පාඨමාලා විෂය නිර්දේශයට අදාලව ශිෂ්‍යයන්ගේ අවශ්‍යතා මත විෂයයන් තෝරා ගැනීමට හැකිවන පරිදි විෂය ඒකක හඳුන්වා දී නොතිබුණු අතර ස්ථාවර විෂය ඒකකයන් සිසුන් විසින් හැදෑරිය යුතු වීම සහ ජාතික ශ්‍රමඅධ්‍යයන ආයතන පනතේ 3(ඊ) වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාල සහ ඒ සමාන ආයතනයන්හි සහයෝගය ලබා ගැනීම දුර්වල තත්වයක පැවතීම ආයතනයේ කාර්යසාධනය කෙරෙහි බලපා ඇති බව නිරීක්ෂණය කෙරේ.

## 4.3 කළමනාකරණ ක්‍රියාකාරකම්

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පැවැත්වූ පාඨමාලාවන් සම්බන්ධයෙන් ශිෂ්‍යයන්ගේ විස්තර ඇතුලත් දත්ත ගබඩාවක් ආයතනයෙහි ස්ථාපනය කර නොතිබූ නිසා ශිෂ්‍ය අනන්‍යතාවය හා පාඨමාලා හදාරා ඇති බව තහවුරු කරගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) 2011 වර්ෂය සඳහා ආයතනයට ලැබුණු රු.89,500 ක පාඨමාලා ආදායම ශ්‍රම අධ්‍යයන ආයතනය සඳහා බැංකු ගිණුමක් ආරම්භ කර නොතිබීම හේතුවෙන් කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ බැංකු ගිණුමට බැරකර තිබූ අතර, එම මුදල් ලබා ගැනීමට අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කල ද විගණන දිනය වන 2016 ජූනි 09 දින තෙක් මෙම මුදල අමාත්‍යාංශයෙන් ලබා දී නොතිබුණි.

(ඇ) ලිඛිත සේවා ගිවිසුමකින් තොරව ආයතනයේ පවිත්‍රතා කටයුතු සඳහා 2014 දෙසැම්බර් 02 සිට බාහිර ආයතනයක් මගින් පවිත්‍රතා සේවාව ලබාගෙන ඇති අතර සමාලෝචිත වර්ෂය වෙනුවෙන්ද ඒ සඳහා රු. 1,135,118 ක් ගෙවා තිබුණි.

(ඈ) පාලක සභාවේ අනුමැතියකින් තොරව සම්පත් දායකයින් දෙදෙනෙකු සඳහා දේශන ගාස්තු ලෙස රු.86,400 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

(ඉ) 2015 වර්ෂයේ ඩිප්ලෝමා සහ සහතික පත්‍ර පිරිනැමීමේ උත්සවය සඳහා වියදම් ඇස්තමේන්තුවක් සකස් කර අනුමත කරගැනීමකින් තොරව රු. 205,266 ක වියදමක් දරා තිබුණි.

## 4.4 අරමුදල් ඌන උපයෝජනය

------------------------------

ඉකුත් වර්ෂ කිහිපයක සිට ජංගම ගිණුමේ සැලකිය යුතු මුදල් ශේෂයක් නිෂ්ක්‍රීයව රඳවා තිබූ අතර එය සමාලෝචිත වර්ෂය අවසානයේ රු.25,450,749 ක් විය. මෙම මුදල් ආයතනයේ අරමුණු ඉටුකර ගැනීමේ කටයුතු සඳහා යෙදවීමට ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොමැති බව නිරීක්ෂණය විය.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 45 ක් හා තත්‍ය සංඛ්‍යාව 11 ක් වීමෙන් පුරප්පාඩු සංඛ්‍යාව 34 ක් විය. සේවයේ නියුක්ත නිලධාරීන්ගෙන් 10 දෙනෙකු කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ සහ කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වන අතර ස්ථිර සේවකයන් බඳවා ගැනීමට 2016 ජූනි මස 30 දින දක්වාම ආයතනය කටයුතු කර නොතිබුණි. මෙවැනි තත්ත්වයක් යටතේ ආයතනයේ කළමනාකරණ තීරණයන් ගැනීමටත් කාර්යයසාධනය ඉහළ මට්ටමකින් පවත්වාගෙන යාමටත් අපහසු වී ඇති බව සහ ආයතනයේ අරමුණු ඉටු කරගැනීමටත් සැලකිය යුතු බලපෑමක් සිදු වී ඇති බව පෙන්නුම් කෙරේ.

(ආ) ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ අනුමත කාර්යය මණ්ඩලයේ අභ්‍යන්තර විගණන තනතුරක් ඇතිකර තිබුණද 2016 සැප්තැම්බර් 30 වන විටත් අදාල තනතුර පුරප්පාඩුව පැවතුණි.

(ඇ) ආයතනයේ රාජකාරි කටයුතු ඉටු කිරීම සඳහා කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ සහ කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් අනුයුක්ත කර ඇති අතර අදාල සේවක පිරිවැය ආයතනයේ 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයෙහි සේවක වියදම් නිවැරදිව ගළපා තිබුණද අනිකුත් වර්ෂවල එසේ ගලපා නොතිබීම නිසා සේවක වියදම් වල සංගතභාවයක් නොතිබුණි.

(ඈ) ආයතනයේ පුරප්පාඩු තනතුරු 13ක් වෙනුවෙන් පුවත්පත් දැන්වීම් සඳහා 2015 පෙබරවාරි මස රු. 50,505 ක පිරිවැයක් දරා තිබුණද විගණන දිනය වූ 2016 ජූනි මස 30 වන දින දක්වාම බඳවා ගැනීම් සිදුකර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

---------------------------------------

### 5.1 ප්‍රසම්පාදන සැලැස්ම

-----------------------

ආයතනය විසින් සමාලෝචිත වර්ෂයේදී අයිතම් 15ක් යටතේ රු. 2,496,000 ක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) ප්‍රසම්පාදන සැලැස්ම මගින් සමාලෝචිත වර්ෂය තුල මිල දී ගැනීම සඳහා සැලසුම් කළ අයිතමයන් 34 ක් මිලදී ගැනීමට කටයුතු කර නොතිබුණු අතර සැලසුම් කල ප්‍රමාණය ඉක්මවා පුටු 28 ක් සහ සහ වායු සමීකරණ යන්ත්‍ර 02 ක් මිලදී ගෙන තිබුණි.

(ආ) මේ අනුව වර්ෂයේ මිලදී ගැනීම් සඳහා වූ සැලැස්ම ඵලදායක නොවන බවත්, අයිතම වර්ග 02 ක් මිලදී ගැනීම සඳහා පමණක් රු. 2,000,269 ක වියදමක් දරා තිබූ අතර එය ඇස්තමේන්තුගත මුදලින් සියයට 80 ක් බවත් නිරීක්ෂණය වුණි.

### 5.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා සැලසුම් කල පාඨමාලා 19 ක් සම්බන්ධයෙන් කරන ලද පරීක්ෂාවේදී පාඨමාලා 12 ක් පමණක් පවත්වා තිබූ අතර සමාලෝචිත වර්ෂයේ පාඨමාලා ආදායම රු. 1,296,995 කින් අඩු වී ඇති බව නිරීක්ෂණය කෙරේ.

### 5.3 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම

---------------------------------------------------------

2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණය |
|---|---|---|
| (අ) | ගිණුම්කරණ කටයුතු. | රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති සහ ගිණුම් කරන ප්‍රතිපත්ති තෝරා ගෙන ඒවා සංගතභාවයෙන් පවත්වා නොගැනීම. |
| (ආ) | මෙහෙයුම් කටයුතු | ආයතනයේ පොදු පරමාර්ථ ඉටු කරගැනීම සඳහා ඉලක්ක සැලසුම් කළ යුතු අතර ඒවා ළඟා කරගැනීම සඳහා ප්‍රමාණවත් උපාය මාර්ග භාවිතා නොකිරීම. |
| (ඇ) | අයවැය ලේඛනමය පාලනය. | අයවැය ලේඛනය මූල්‍ය පාලන කාරකයක් ලෙස භාවිතා නොකිරීම. |
| (ඈ) | කාර්යමණ්ඩල පරිපාලනය. | තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබීම. |
| (ඉ) | පුස්තකාලය පරිපාලනය. | පුස්තකාල පොත් පරිහරණය කිරීම කෙරෙහි යොමු කළ යුතුය. |
| (ඊ) | ස්ථාවර වත්කම් පරිපාලනය. | වාර්ෂික සමීක්ෂණයක් නොපැවැත්වීම. |